# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120
ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1561/2023
ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2023
දිනය / திகதி / Date – 12/12/2023 පැය 1045

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම්**

**01. 2023.12.11 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 102 | 540 | බැරල් 04<br>තඹ දඟර 02<br>ගෑස් ලිප් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් සහ දේපල අදාළ පොලිසියට ඉදිරිපත් කර ඇත.

**02. මත්පෙති සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුර.**

2023.12.11 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත බොරැල්ල පොලිස් වසමේ බොරැල්ල ප්‍රදේශයේ වැටලීමක් සිදු කර **මත්පෙති 108 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන බොරැල්ල පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන බොරැල්ල, කොළඹ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. වැඩිදුර විමර්ශන බොරැල්ල පොලිස් ස්ථානය මඟින් සිදු කරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

2023.12.11 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැල්ලම්පිටිය පොලිස් වසමේ වැල්ලම්පිටිය ප්‍රදේශයේ වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 07 ක් සමඟ සැකකාරියක් අත්අඩංගුවට ගෙන වැල්ලම්පිටිය** පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 48 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකාරියෙකි. වැඩිදුර විමර්ශන වැල්ලම්පිටිය පොලිස් ස්ථානය මඟින් සිදු කරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර

2023.12.11 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මීගහවත්ත පොලිස් වසමේ සියඹලාපේ ප්‍රදේශයේ වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 04 මිලි ග්‍රෑම් 500 ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැල්ලම්පිටිය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන සියඹලාපේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. වැඩිදුර විමර්ශන මීගහවත්ත පොලිස් ස්ථානය මඟින් සිදු කරනු ලබයි.

## 05. බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කර ට්‍රැක්ටර් රථයකට පටවමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුර.

2023.12.11 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වාලච්චේන පොලිස් වසමේ නාවල්ලඩි ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කර ට්‍රැක්ටර් රථයකට පටවමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වාලච්චේන පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 27ක් වන වාලච්චේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** වැඩිදුර විමර්ශන වාලච්චේන පොලිස් ස්ථානය මඟින් සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**